# සෞඛ්‍ය අමාත්‍යාංශයෙ හි විධායක සේවා ගණය (නීති නිලධාරී) සඳහා වන බඳවා ගැනීම් පරිපාටිය.

දුරකථන / தொலைபேசி / Telephones: 011-2136600, 011-2136650, 011-2136700
ලේකම් / செயலாளர் / Secretary: 011-2136602
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2369302, 011-2369305
විද්‍යුත් තැපැල / மின் - அஞ்சல் / E - mail: sec-psc@sltnet.lk
වෙබ් අඩවිය / இணையத்தளம் / Website: www.psc.gov.lk

Addl Sec (A)

රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය
அரசாங்க சேவை ஆணைக்குழு அலுவலகம்
OFFICE OF THE PUBLIC SERVICE COMMISSION

අංක 177, නාවල පාර, නාරාහේන්පිට, කොළඹ 05.
இல. 177, நாவல வீதி, நாரஹேன்பிட்ட, கொழும்பு 05.
No. 177, Nawala Road, Narahenpita, Colombo 05.

මගේ අංකය / எனது இல. / My No.: PSC/EST/4/1/13/1/2012
ඔබේ අංකය / உமது இல. / Your No.: 06/B/02/95
දිනය / திகதி / Date: 2013.02.14

21 FEB 2013

22 FEB 2013 Deputy Director General (Admin)

Secretary 15 FEB 2013 Ministry of Health

ලේකම්,

සෞඛ්‍ය අමාත්‍යාංශය.

**<u>සෞඛ්‍ය අමාත්‍යාංශයේ නීති නිලධාරි තනතුරට බඳවා ගැනීමේ පරිපාටිය.</u>**

උක්ත කරුණ හා සම්බන්ධ ඔබේ සමාංක හා 2013.01.31 දිනැති ලිපිය හා බැඳේ.

02. ඒ අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාව අනුමත කරන ලද, එම කොමිෂන් සභාවේ ලේකම්ගේ අත්සනින් යුත් උක්ත බඳවා ගැනීමේ පරිපාටියේ මුල් පිටපත මේ සමග එවමි.

03. මේ පිළිබඳව අදාළ නිලධාරීන් දැනුවත් කරන ලෙසත්, අදාළ බඳවාගැනීම් පරිපාටිය ඔබ අමාත්‍යාංශයේ වෙබ් අඩවියේ පළකරන ලෙසත් වැඩිදුරටත් දන්වමි.

එම්.ඩී.ජේ.ප්‍රසාද්
සහකාර ලේකම් (ආයතන)
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ
ලේකම් වෙනුවට

පිටපත් -
01. ලේකම් - ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව - (මුල් පිටපත මේ සමඟ එවමි.)
02. ආයතන අධ්‍යක්ෂ ජනරාල් - (මුල් පිටපත මේ සමඟ එවමි.)

DDG (A)

D16 2013/2/22

(73) DDG (A) I (18)


දුරකථන / தொலைபேசி / Telephones: 011-2136600, 011-2136650, 011-2136700

ලේකම් / செயலாளர் / Secretary: 011-2136602

ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2369302, 011-2369305

විද්‍යුත් තැපැල / மின் - அஞ்சல் / E-mail: sec-psc@sltnet.lk

වෙබ් අඩවිය / இணையத்தளம் / Website: www.psc.gov.lk


මගේ අංකය / எனது இல. / My No.PSC/EST/4/1/13/1/2012

ඔබේ අංකය / உமது இல. / Your No.

# රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය
## அரசாங்க சேவை ஆணைக்குழு அலுவலகம்
## OFFICE OF THE PUBLIC SERVICE COMMISSION

දිනය / திகதி / Date 2013.01.03


අංක 177, නාවල පාර, නාරාහේන්පිට, කොළඹ 05.
இல. 177, நாவல வீதி, நாரஹேன்பிட்டி, கொழும்பு 05.
No. 177, Nawala Road, Narahenpita, Colombo 05.


ලේකම්,

සෞඛ්‍ය අමාත්‍යාංශය.

**සෞඛ්‍ය අමාත්‍යාංශයේ නීති නිලධාරි තනතුරට බඳවා ගැනීමේ පරිපාටිය.**

උක්ත කරුණ සම්බන්ධ ඔබේ අංක 06/B/02/95 හා 2012.06.27 දිනැති ලිපිය හා බැඳේ.

02. එම ලිපිය සමග එවා ඇති සෞඛ්‍ය අමාත්‍යාංශයේ නීති නිලධාරි තනතුර සඳහා වන බඳවා ගැනීමේ පරිපාටිය, මේ සමග අමුණා ඇති සංශෝධනයන්ට යටත්ව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2013.01.03 දින අනුමත කර ඇති බව එම කොමිෂන් සභාවේ නියමය පරිදි කාරුණිකව දන්වමි.

03. එම සංශෝධනයන් අනුව සකස් කරන ලද බඳවා ගැනීමේ පරිපාටියේ මුල් පිටපත් 05 ක් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ගේ අත්සන සඳහා ඉදිරිපත් කරන මෙන්ද වැඩිදුරටත් දන්වමි.

එම්.ඩී.ජේ.ප්‍රසාද්
සහකාර ලේකම් (ආයතන)
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ
ලේකම් වෙනුවට

පිටපත් - 01. ලේකම්, ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව
02. ආයතන අධ්‍යක්ෂ ජනරාල්

Deputy Director General 15 JAN 2013 384

16 JAN 2013 සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව කොළඹ 10.

Secretary 10 JAN 2013 Ministry of Health

D/6

**සෞඛ්‍ය අමාත්‍යාංශයෙ හි**

**විධායක සේවා ගණය (නීති නිලධාරී) සඳහා වන**

**බඳවා ගැනීමේ පරිපාටිය**

## 01. සම්බන්ධ වන ආයතන

| | | | |
|---|---|---|---|
| 1.1 | **දෙපාර්තමේන්තුව** : අදාළ නොවේ | **යොමු අංකය** : - | **දිනය** : - |
| 1.2 | **අමාත්‍යාංශය** : සෞඛ්‍ය | **යොමු අංකය** : 06/B/02/95 | **දිනය** : 2013.01. 31 |
| 1.3 | **කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුරු අනුමත කිරීම** | **යොමු අංකය** : DMS/ C/ 08/ 45 | **දිනය** : 2012.05.10 |
| 1.4 | **ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ නිර්දේශය** | **යොමු අංකය** : EST-3/RECRU/04/6643 | **දිනය**: 2012.01.25 |
| 1.5 | **ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය** | **යොමු අංකය** : NSCC/4/13/SR 11 | **දිනය**: 2012.06.14 |
| 1.6 | **රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය** | **යොමු අංකය** : PSC/EST/4/1/13/1/2012 | **දිනය**: 2013.01.03 |

## 02. පත් කිරීම් බලධරයා පිළිබඳ විස්තර

2.1 **පත් කිරීමේ බලධරයා** : රාජ්‍ය සේවා කොමිෂන් සභාව

## 03. සේවා ගණය පිළිබඳ විස්තර

3.1 **සේවා ගණය** : විධායක

3.2 **ශ්‍රේණි** : III , II, I ශ්‍රේණි

3.3 **පැවරෙන කාර්ය භාරය පිළිබඳ පොදු නිර්වචනය** : මූලික සුදුසුකම වශයෙන් පිළිගත් විශ්ව විද්‍යාලක උපාධියක් අවශ්‍ය වන්නා වූද සෞඛ්‍ය අමාත්‍යාංශයේ / සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ හා එහි විෂයය පථයට අයත් රාජ්‍ය ආයතන වල පනත් කෙටුම්පත් , රෙගුලාසි වැනි නීතිමය ලියවිලි සකස් කිරීම , නීතිපති දෙපාර්තමේන්තුව හා සම්බන්ධීකරණය, මානව හිමිකම් පැමිණිලි සම්බන්ධව ක්‍රියා කිරීම සහ අමාත්‍යාංශයේ / දෙපාර්තමේන්තුවේ නිලධාරීන් රාජකාරී විෂයය පථයට අදාළ කරුණක් මත වග උත්තරකරුවන් වන නඩු සම්බන්ධයෙන් උපදෙස් ලබා දීම හා නඩු සඳහා සහභාගි වීම වැනි කාර්යයන් පැවරෙන නිලධර ගණයකි.

## 04. තනතුරේ ස්වභාවය : ස්ථිර. විශ්‍රාම වැටුප් සහිත.

## 05. වැටුප්

5.1 වැටුප් කේත අංකය : SL -1- 2006

5.2 වැටුප් පරිමාණය : රු: 22,935 -10 x 645 - 8 x 790 - 17 x 1050 - 53,555/-

5.3 ශ්‍රේණි ක්‍රමයට අදාළ ආරම්භක වැටුප් පියවර

| ශ්‍රේණිය | වැටුප් පියවර | වැටුප් තලය ( රු.) |
|---|---|---|
| III | 01 | රු: 22,935/- |
| II | 12 | රු: 30,175/- |
| I | 20 | රු: 36,755/- |

## 06. සේවා ගණයට අයත් තනතුරු

6.1 අනුමත තනතුරු , අනුමත තනතුරු සංඛ්‍යාව හා පැවරෙන කාර්යයන් :

| අනු අංකය | අනුමත තනතුරු නාම | අනුමත තනතුරු සංඛ්‍යාව | කාර්යයන් |
|---|---|---|---|
| 01 | නීති නිළධාරි | 04 | i. .දෙපාර්තමේන්තුවේ සහ අමාත්‍යාංශයේ නීතිමය උපදෙස් ලබාගත යුතු අවස්ථාවලදී අවශ්‍ය කටයුතු කිරීම සහ දෙපාර්තමේන්තුවට හා අමාත්‍යාංශයට එරෙහිව නඩු පවරනු ලබන අවස්ථාවලදී නීතිපති දෙපාර්තමේන්තුව හරහා නීතිමය ආරක්ෂාව ලබා දීම හා සම්බන්ධීකරණය.<br>ii. වන්දි, බැදුම්කරු, රක්ෂණ වියදම්, ඇප, ණය අය කරවා ගැනීම සම්බන්ධයෙන් මූලික පියවර ගැනීම, අනවසර පදිංචිකරුවන් ඉවත් කිරීමේ නඩු කටයුතු සිදු කිරීම සහ බේරුම් කරණ කටයුතු සඳහා සහභාගී වීම.<br>iii. අමාත්‍යාංශය යටතේ පාලනය වන පනත් සංශෝධනය කිරීම, රෙගුලාසි සම්පාදනය කිරීම ආදී විෂයයන්හි මූලික පියවර සිදු කිරීම හා නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව සමග සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම.<br>iv. අමාත්‍යාංශයට අදාළ ගිවිසුම් හා අවබෝධතා ගිවිසුම් කෙටුම්පත් කිරීම හා සුපරීක්ෂණය.<br>v. ආයතන ප්‍රධානියා විසින් පවරනු ලබන අනෙකුත් රාජකාරි |
| 02 | ප්‍රධාන නීති නිලධාරි | 01 | i. නීති අංශයේ වැඩ ප්‍රමුඛතා අනුව සංවිධානය කිරීම.<br>ii. අදාල කර්තව්‍යයන් සහ යෝග්‍ය පුද්ගලයා තෝරාගැනීම සහ අවසාන වැඩ කටයුතු නිම කිරීමට උපදෙස්දීම.<br>iii. අත්‍යවශ්‍ය හදිසි රාජකාරි, කර්තව්‍යයන් වෙත ප්‍රමුඛතාවය ලබාදෙමින් වැඩ කාර්යය සඳහා කේන්ද්‍රගත කිරීම සහ දී ඇති කාලවකවානුව තුල නිම කිරීම.<br>iv. අනිකුත් කාර්යය මණ්ඩල සාමාජිකයන්ගේ වැඩ අධීක්ෂණය කිරීම හා ඇගයීම.<br>v. පරිපාලනමය සහ නීතිමය ලිපිලේඛන කෙටුම්පත් කිරීමේදී ප්‍රවීනතාවය සහ නීතිමය තත්වය සුපරීක්ෂා කිරීම හා ඊට අදාල උපදෙස් ලබාදීම.<br>vi. සංකීර්ණ ගැටළුවලදී සෙසු නිලධාරීන්ට උපදෙස් ලබාදීම.<br>vii. විශ්ලේෂණාත්මක ප්‍රවේශයක් තුල අමාත්‍යාංශයට අදාල සියළු ගැටළු සම්බන්ධයෙන් විකල්ප ක්‍රමෝපායන් සෙවීම. |

6.2 ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව :

| අනු අංකය | අනුමත තනතුරු නාම | අනුමත තනතුරු සංඛ්‍යාව |
|---|---|---|
| 01 | නීති නිලධාරි | 04 |
| 02 | ප්‍රධාන නීති නිලධාරි | 01 |

## 07. බඳවා ගැනීමේ ක්‍රමය

### 7.1 බඳවා ගන්නා අනුපාතය

| ධාරාව | ප්‍රතිශතය |
|---|---|
| විවෘත | 100% |

### 7.2 විවෘත බඳවා ගැනීම

7.2.1 **බඳවා ගන්නා ශ්‍රේණිය** : III ශ්‍රේණිය

7.2.2 **සුදුසුකම්** :

7.2.2.1 **අධ්‍යාපන/වෘත්තීය සුදුසුකම්** : විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් නීතිය පිළිබඳ උපාධියක් ලබා තිබීම හෝ ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයෙකු වශයෙන් දිවුරුම් දී තිබීම.

7.2.2.2 **පළපුරුද්ද** : දිවිරුම් දීමෙන් අනතුරුව නීතිඥයකු වශයෙන් වසර 03කට නොඅඩු සක්‍රීය වෘත්තීය පළපුරුද්දක් ලබා තිබීම.

7.2.2.3 **කායික සුදුසුකම්** : සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත වීම.

7.2.2.4 **වෙනත්** :

i. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය

ii අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත වීම.

iii. මනා ලෙස ඉංග්‍රිසි භාෂාව හැසිරවීමට හැකි වීම.

iv. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය 7.2.2 සිට 7.2.3 දක්වා සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ / ගැසට් පත්‍රයේ සඳහන් වන දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබීම.

7.2.3 **වයස** :

7.2.3.1 **අවම සීමාව** : අවුරුදු 21 නොඅඩු

7.2.3.2 **උපරිම සීමාව** : අවුරුදු 35 නොවැඩි

7.2.4 **බඳවා ගැනීමේ ක්‍රමය :** ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය

7.2.4.1 **ලිඛිත විභාගය** : අදාළ නොවේ.

7.2.4.2 **වෘත්තීය පරීක්ෂණය** : අදාළ නොවේ.

7.2.4.3 **ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය:**

| **පරීක්ෂා කර ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ක්ෂේත්‍ර** | **උපරිම ලකුණු ප්‍රමාණය** | **තෝරා ගැනීම සඳහා සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය** |
|---|---|---|
| 1. අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 30 | අදාළ නොවේ |
| 2. අතිරේක වෘත්තිය සුදුසුකම් | 10 | |
| 3. අතිරේක පළපුරුද්ද | 25 | |
| 4. පරිගණක හැකියාව | 15 | |
| 5. ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාවය | 15 | |
| 6. සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතා | 05 | |
| **එකතුව** | 100 | |

සටහන: ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතා මත වැඩිම ලකුණු ලබා ගත් අයදුම්කරුවන් අතරින් පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව බඳවා ගනු ලැබේ.

7.2.4.3.1 **ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත් කරන බලධරයා :** රාජ්‍ය සේවා කොමිෂන් සභාව

7.2.4.4 **සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය ( ලකුණු ලබා දෙනු නොලැබේ.)**
**ඉටුකර ගැනීමට අපේක්ෂිත අරමුණු :** අදාළ නොවේ.

7.2.5 **අයදුම්පත් කැඳවීමේ ක්‍රමය :** රජයේ ගැසට් පත්‍රයේ දැන්වීම් පළ කිරීම හෝ ප්‍රසිද්ධ දැන්වීම් පළකිරීම සහ වෙබ් අඩවියේ දැන්වීම් පළ කිරීම මගින් අයදුම්පත් කැඳවනු ලැබේ.

7.3 **සීමිත බඳවා ගැනීම** : අදාළ නොවේ.

7.4 **කුසලතා මත බඳවා ගැනීම** : අදාළ නොවේ.

## 08. කාර්යක්ෂමතා කඩඉම්

8.1

| කුමන කාර්යක්ෂමතා කඩඉම ද යන වග | කාර්යක්ෂමතා කඩඉම සමත්විය යුත්තේ කොපමණ වසර ගණනකට පෙරද | කාර්යක්ෂමතා කඩඉමේ ස්වභාවය ලිඛිත පරීක්ෂණය/වෘත්තීය පරීක්ෂණය/සහතිකපාඨමාලා/ වෙනත් |
|---|---|---|
| 1 වන කාර්යක්ෂමතා කඩඉම | III වැනි ශ්‍රේණියට බඳවා ගෙන වසර තුන (03) ක් ගතවීමට පෙර | ලිඛිත (ඇමුණුම - 01) |
| 2 වන කාර්යක්ෂමතා කඩඉම | II වැනි ශ්‍රේණියට උසස් වී වසර තුනක් (03) ගතවීමට පෙර | ලිඛිත (ඇමුණුම - 02) |
| 3 වන කාර්යක්ෂමතා කඩඉම | I වැනි ශ්‍රේණියට උසස් වී වසර පහක් (05) ගතවීමට පෙර | ලිඛිත (ඇමුණුම - 03) |

8.2 **කාර්යක්ෂමතා කඩඉම පවත්වනු ලබන්නේ කොපමණ කාලයකට වරක් ද :** වසරකට දෙවරක්

8.3 **කාර්යක්ෂමතා කඩඉම් වලට අදාල පරීක්ෂණය පවත්වනු ලබන බලධරයන් කවුරුන්ද :**

**1 වන කාර්යක්ෂමතා කඩඉම**
**2 වන කාර්යක්ෂමතා කඩඉම**
**3 වන කාර්යක්ෂමතා කඩඉම**

} විභාග කොමසාරිස් ජනරාල් හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන ආයතනයක් මගින්

## 09. රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය

| ශ්‍රේණිය | ලබාගත යුතු ප්‍රවීණතාවය |
|---|---|
| 1. රාජ්‍ය භාෂාව | රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යයකින් සේවයට බැදුණු නිලධාරීන් විසින් නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාව පරිවාස කාලය තුළ ලබා ගත යුතුය. |
| 2. අනෙක් රාජ්‍ය භාෂාව | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 07/2007 හා ඊට ආනුෂංගික චක්‍රලේඛ විධි විධාන අනුව අදාළ මට්ටමේ ප්‍රවීණතාව ලබා ගත යුතුය. |

## 10. ශ්‍රේණි උසස් කිරීම

### 10.1 III වන ශ්‍රේණියේ සිට II ශ්‍රේණියට උසස් කිරීම.

#### 10.1.1 සාමාන්‍ය කාර්ය සාධනය අනුව

**10.1.1.1 සපුරාලිය යුතු සුදුසුකම් :**

(i) පත්වීම ස්ථිර කර තිබීම.

(ii) නිලධර ගණයේ III ශ්‍රේණියේ අවම වශයෙන් වසර දහය (10) ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක දහය (10) ක් උපයාගෙන තිබීම.

(iii) අනුමත කාර්යසාධන අගැයීමේ පරිපාටිය අනුව උසස් වීමේ දිනට පෙරාතුව වූ වසර 10 ක් තුල සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්යයසාධනයක් පෙන්නුම් කර තිබීම.

(iv) උසස් වීම් දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුළම සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

(v) අදාළ මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබා ගෙන තිබීම.

(vi) අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත් වී තිබීම.

**10.1.1.2 උසස් කිරීමේ ක්‍රමය:** සුදුසුකම් සම්පූර්ණ කරන නිළධරයන් විසින් නියමිත ආකෘති පත්‍රය අනුව ඉල්ලීමක් කරනු ලැබූ විට සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි II ශ්‍රේණියට උසස් කිරීම පත්කිරීම් බලධරයා විසින් සිදු කරනු ලැබේ.

#### 10.1.2 සුවිශේෂී කාර්ය සාධනය අනුව

**10.1.2.1 සපුරාලිය යුතු සුදුසුකම් :**

(i) පත්වීම ස්ථිර කර තිබීම.

(ii) නිළධර ගණයේ III ශ්‍රේණියේ වසර හය (06) ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා නියමිත දිනට වැටුප් වර්ධක හය ( 06) උපයාගෙන තිබීම.

(iii) අනුමත කාර්යසාධන අගැයීමේ පරිපාටිය අනුව පූර්වාසන්න වසර හය (06) තුළම සුවිශේෂී කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

(iv) උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුළම සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

(v) අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත් වී තිබීම.

(vi) අදාළ මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාව නියමිත කාලය තුළ ලබාගෙන තිබීම.

**සංලක්ෂය** : (සුවිශේෂී කාර්යසාධනය යටතේ උසස් කිරීම් සඳහා වන පරීක්ෂණ වලට පෙනී සිටීම)

1. සුවිශේෂී කාර්යසාධනය ඇගයීමේ ක්‍රම වේදයක් රජය විසින් හඳුන්වාදී ක්‍රියාත්මක කරන තෙක් දැනට ක්‍රියාත්මක වන වාර්ෂික කාර්යසාධන ඇගයීමේදී සතුටුදායක මට්ටම හෝ ඊට ඉහළ කාර්යසාධනයක් පෙන්නුම් කරනු ලැබ ඇති තැනැත්තන්ට සුවිශේෂී කාර්යසාධනය යටතේ උසස් කිරීම් සඳහා වන ලිඛිත අභියෝගතා පරීක්ෂණය සඳහා පෙනී සිටීමට අවස්ථාව සලසා දෙනු ලැබේ.

2. සාමාන්‍ය මට්ටමේ කාර්ය සාධනය අනුව උසස් කිරීමේදී නියමිත දිනට කාර්යක්ෂමතා කඩඉම සමත් නොවන නිලධාරීන්ගේ උසස්වීම් දිනය කාර්යක්ෂමතා කඩඉම සමත් වීමට ප්‍රමාද වූ කාලයට සමාන කාලයකින් ප්‍රමාද කළ යුතුය.

### 10.1.2.2 උසස් කිරීමේ ක්‍රමය :

ඉහත සුදුසුකම් සපුරාලන නිලධරයන්ට පත්කිරීම් බලධරයා අනුමත කරන ආයතනයක් විසින් පවත්වනු ලබන ලිඛිත අභියෝග්‍යතා පරීක්ෂණයකට පෙනී සිටිය හැක. ඉන් සමත්වන්නන් විසින් නියමිත ආකෘති පත්‍රය අනුව පත්කිරීම් බලධරයා වෙත ඉල්ලීමක් කරනු ලැබූ විට, පත්කිරීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කරනු ලැබේ.අදාල සෙසු අවශ්‍යතාවන් ද සම්පූර්ණ කර ඇති නිලධරයන් පත්කිරීමේ දිනසිට වසර 06ක් සම්පූර්ණ වන දිනට ක්‍රියාත්මක වන පරිදි II ශ්‍රේණියට උසස් කිරීම පත්කිරීම් බලධරයා විසින් සිදු කරනු ලැබේ.

(ලිඛිත අභියෝග්‍යතා පරීක්ෂණයේ ක්‍රමවේදය **ඇමුණුම -04** )

සටහන :-

1. සුවිශේෂී කාර්ය සාධනය යටතේ උසස් කිරීම් ලබා දීමේදී පවත්වනු ලබන පරීක්ෂණයෙන් සමත් වීම සඳහා අවම වශයෙන් ලකුණු 60% ක් ලබාගත යුතුය. තවද, සුවිශේෂී කාර්ය සාධනය යටතේ උසස් කිරීමේ පරීක්ෂණය වර්ෂයකට එක් වරක් පවත්වනු ලබන අතර, නිලධරයකුට පෙනී සිටිය හැක්කේ එක් වතාවක් පමණි.
2. නිලධරයකුට පාලනය කළ නොහැකි විශේෂ හේතුවක් මත නියමිත දිනට සුවිශේෂී කාර්ය සාධනය යටතේ උසස් කිරීමේ පරීක්ෂණයට පෙනී සිටීමට නොහැකි වූ අවස්ථාවන්හිදී පසුව පැවැත්වෙන අභියෝග්‍යතා පරීක්ෂණයට එම නිලධරයාට පෙනී සිටිය හැක. එවැනි නිලධරයකු සුවිශේෂී කාර්ය සාධනය යටතේ උසස් කිරීම සිදු කරන දිනය ලෙස සලකනුයේ එම විභාගය සමත් වූ දින වේ.

## 10.2 II වන ශ්‍රේණියේ සිට I ශ්‍රේණියට උසස් කිරීම.

### 10.2.1 සාමාන්‍ය කාර්ය සාධනය අනුව :

#### 10.2.1.1 සපුරාලිය යුතු සුදුසුකම්

(i) නීති ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් ලබා තිබීම.

(ii) නිලධර ගණයේ II ශ්‍රේණියේ වසර හත (07) ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක හත (07) ක් උපයාගෙන තිබීම.

(iii) උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුළම සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

(iv) අනුමත කාර්යසාධන අගැයීමේ පරිපාටිය අනුව උසස් වීමේ දිනට පෙරාතුව වූ වසර හත (07)ක් තුළ සතුටුදායක හෝ ඊට ඉහළ කාර්යසාධනයක් පෙන්නුම් කර තිබීම.

(v) අදාල කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ නියමිත දිනට සමත් වී තිබීම.

10.2.1.2 **උසස් කිරීමේ ක්‍රමය** : සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් විසින් නියමිත ආකෘති පත්‍රය අනුව පත්කිරීම් බලධරයා වෙත ඉල්ලීමක් කරනු ලැබූ විට, පත්කිරීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි I ශ්‍රේණියට උසස් කිරීම පත්කිරීම් බලධරයා විසින් සිදු කරනු ලැබේ.

11. **තනතුරු වලට පත් කිරීම**

11.1 **සුදුසුකම්**

| **තනතුර** | **සුදුසුකම්** |
|---|---|
| ප්‍රධාන නීති නිලධාරී | I වැනි ශ්‍රේණියේ නීති නිලධාරීන් අතුරින් සේවා පළපුරුද්ද සහ කුසලතාවය අනුව පත් කරනු ලැබේ. |

11.2 **තෝරා ගනු ලබන ක්‍රමය** : ඇමුණුම - 05 හි ඇත.

12. **රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන අර්ථ නිරූපන වලට පර්බාහිර වන්නා වූ අර්ථ නිරූපන :**

" සක්‍රිය සේවා කාලය " යනු , ස්වකීය තනතුරට අදාළ වැටුප් ලබමින්, සත්‍ය වශයෙන්ම රාජකාරියෙහි යෙදී සිටි සේවා කාලය වේ. රජයෙන් අනුමත ප්‍රසූත නිවාඩු හැර අනිකුත් සියලුම වැටුප් රහිත නිවාඩු කාල පරිච්ඡේදයන් සක්‍රිය සේවා කාලය සඳහා ගණනය කරනු නොලබන්නේ ය.

13. සෑම පත්වීමක් සම්බන්ධයෙන්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක 1589/30 හා 2009.02.20 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශිත කාර්ය පර්පාටික රීති වල දැක්වෙන කොන්දේසි හා ආයතන සංග්‍රහයේ විධිවිධාන අදාලවේ.

14. මෙම බඳවා ගැනීමේ පටිපාටියේ විධිවිධාන සලසා නොමැති යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ.

15. **සේවයේ යෙදී සිටින්නන් අන්තර්ග්‍රහණය කිරීම:** අදාල විස්තර ඇමුණුම 06 ඇත

සකස් කළේ අත්සන : ..................................
(විෂය භාර කණිෂ්ඨ මාණ්ඩලික නිලධරයා)
නම : එම්.ඒ.ආර්.පී.අභයගුණවර්ධන
තනතුර : අධ්‍යක්ෂ (පාලන) VI
දිනය : 2013 /01/18

පරීක්ෂා කළේ අත්සන : ..................................
(විෂය භාර ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධරයා)
නම : වී.වික්‍රමරාජා
තනතුර : නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන) I
දිනය : 2013.01.18

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන : ..................................
(දෙපාර්තමේන්තු ප්‍රධානියා )
නම : වෛද්‍ය පී.ජී.මහීපාල
තනතුර : සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්

දිනය : 2013.01.24

නිල මුද්‍රාව : වෛද්‍ය පී.ජී. මහීපාල
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්
සෞඛ්‍ය අමාත්‍යාංශය,
385, "සුවසිරිපාය",
පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

---

යොමු අංකය : 06/B/02/95

සෞඛ්‍ය අමාත්‍යාංශයෙහි විධායක සේවා ගණයේ නීති නිලධාරී තනතුර සඳහා යෝජිත මෙම බඳවා ගැනීමේ පරිපාටිය අනුමත කිරීම සඳහා නිර්දේශ කරමි.

වෛද්‍ය වයි. ඩී. නිහාල් ජයතිලක
ලේකම්
සෞඛ්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

අත්සන : ..................................
නම : වෛද්‍ය වයි.ඩී.නිහාල් ජයතිලක
ලේකම්
සෞඛ්‍ය අමාත්‍යාංශය

දිනය : 2013/01/31

නිල මුද්‍රාව :

..................................

---

යොමු අංකය : PSC/EST/4/1/13/1/2012

සෞඛ්‍ය අමාත්‍යාංශයේ හි විධායක සේවා ශ්‍රේණිය සඳහා වන මෙම බඳවා ගැනීමේ පරිපාටිය 2013.01.03 දින රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලදි.

අත්සන : චන්ද්‍රා සේනාරත්න
නම : ..................................
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව

දිනය : 2013 02 13

නිල මුද්‍රාව : ටී. එම්. එල්. සී. සේනාරත්න
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
අංකය. 177, නාවල පාර, නාරාහේන්පිට,
කොළඹ-05.

ඇමුණුම - 01

## සෞඛ්‍ය අමාත්‍යාංශයේ විධායක සේවා ගණය (නීති නිලධාරී)

01. **විභාගයේ නම** : සෞඛ්‍ය අමාත්‍යාංශයේ නීති නිලධාරී තනතුරේ III වන ශ්‍රේණියට නියමිත කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය

02. **විභාගය පිළිබඳ විස්තර** :

| ප්‍රශ්න පත්‍රය | කාලය | ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| 1. ආයතන රෙගුලාසි | පැය 01යි | 100 | 40 % |
| 2. මුදල් රෙගුලාසි | පැය 01යි | 100 | 40 % |

03. **විභාගය පවත්වනු ලබන බලධරයා** : විභාග කොමසාරිස් ජනරාල් හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන ආයතනයක් මගින්

04. **විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක්ද යන වග** : වසරකට දෙවරක්

05. **විභාගය සඳහා වන විෂය නිර්දේශය** :

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| 1.ආයතන රෙගුලාසි | • **රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පරිපාටික රීති**<br>හා<br>• **ආයතන සංග්‍රහයේ ,**<br>II , IV , V , VII , VIII , XII , XIII පරිච්ඡේද |
| 2. මුදල් රෙගුලාසි | • **මුදල් රෙගුලාසි සංග්‍රහයේ ,**<br>I , II , III , IV , VI , VIII පරිච්ඡේද<br>හා<br>• **රජයේ ප්‍රසම්පාදන ක්‍රියා පටිපාටිය** |

සකස් කළේ :
අත්සන : ..........
නම : එම්.ඒ.ආර්.පී.අභයගුණවර්ධන
තනතුර : අධ්‍යක්ෂ (පාලන) VI
දිනය : 2013/01/18

පරීක්ෂා කළේ :
අත්සන : ..........
නම : වී.වික්‍රමරාජා
තනතුර : නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන) I
දිනය : 2013.01.18

අත්සන : ..........
(දෙපාර්තමේන්තු ප්‍රධාන)
නම : වෛද්‍ය පී.ජී.මහීපාල
තනතුර : සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්
දිනය : 2013.01.24
නිලමුද්‍රාව : වෛද්‍ය පී. ජී. මහීපාල
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්
සෞඛ්‍ය අමාත්‍යාංශය,
385, "සුවසිරිපාය",
පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

ඇමුණුම - 02

**සෞඛ්‍ය අමාත්‍යාංශයේ විධායක සේවා ගණය (නීති නිලධාරි)**

01. **විභාගයේ නම** : සෞඛ්‍ය අමාත්‍යාංශයේ නීති නිලධාරි තනතුරේ II වන ශ්‍රේණියට නියමිත කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය

02. **විභාගය පිළිබඳ විස්තර** :

| ප්‍රශ්න පත්‍රය | කාලය | ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| 1. නීතිය | පැය 03යි | 100 | 40 % |

03. **විභාගය පවත්වනු ලබන බලධරයා** : විභාග කොමසාරිස් ජනරාල් හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන ආයතනයක් මගින්

04. **විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක්ද යන වග** : වසරකට දෙවරක්

06. **විභාගය සඳහා වන විෂය නිර්දේශය** :

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| 1.නීතිය | • අමාත්‍යාංශ / දෙපාර්තමේන්තු විෂයය පථයට අයත් වන පනත්<br>i ශ්‍රී ලංකාවේ නීති පද්ධති<br>ii ගිවිසුම් නීතිය<br>iii නියෝජිතායතන නීතිය |

සකස් කළේ :
අත්සන :
නම : එම්.ඒ.ආර්.පී.අභයගුණවර්ධන
තනතුර : අධ්‍යක්ෂ (පාලන) VI
දිනය : 2013/01/18

පරීක්ෂා කළේ :
අත්සන :
නම : වී.වික්‍රමරාජා
තනතුර : නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන) I
දිනය : 2013-01-18

අත්සන :
(දෙපාර්තමේන්තු ප්‍රධාන)
නම : වෛද්‍ය පී.ජී.මහිපාල
තනතුර : සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්
දිනය : 2013.01.24
නිලමුද්‍රාව :

වෛද්‍ය පී. ජී. මහීපාල
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්
සෞඛ්‍ය අමාත්‍යාංශය,
385, "සුවසිරිපාය",
පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

ඇමුණුම - 03

## සෞඛ්‍ය අමාත්‍යාංශයේ විධායක සේවා ගණය (නීති නිලධාරි)

01. **විභාගයේ නම** : සෞඛ්‍ය අමාත්‍යාංශයේ නීති නිලධාරි තනතුරේ I වන ශ්‍රේණියට නියමිත කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය

02. **විභාගය පිළිබඳ විස්තර** :

| ප්‍රශ්න පත්‍රය | කාලය | ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| 1. කළමනාකරණය | පැය 03යි | 100 | 40 % |

03. **විභාගය පවත්වනු ලබන බලධරයා** : විභාග කොමසාරිස් ජනරාල් හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන ආයතනයක් මගින්

04. **විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක්ද යන වග** : වසරකට දෙවරක්

05. **විභාගය සඳහා වන විෂය නිර්දේශය** :

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| 1.කළමනාකරණය | i කළමනාකරණ මූලධර්ම.<br>ii කළමනාකරණ ශ්‍රිතයන්.<br>iii සහභාගිත්ව කළමනාකරණය<br>iv කළමනාකරණ පරිසරය |

සකස් කළේ :
අත්සන : ..........
නම : එම්.ඒ.ආර්.පී.අභයගුණවර්ධන
තනතුර : අධ්‍යක්ෂ (පාලන) VI
දිනය : 2013/01/18

පරීක්ෂා කළේ :
අත්සන : ..........
නම : වී.වික්‍රමරාජා
තනතුර : නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන) I
දිනය : 2013.01.18

අත්සන : ..........
(දෙපාර්තමේන්තු ප්‍රධාන)
නම : වෛද්‍ය පී.ජී.මහීපාල
තනතුර : සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්
දිනය : 2013.01.24
නිලමුද්‍රාව : වෛද්‍ය පී. ජී. මහීපාල
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්
සෞඛ්‍ය අමාත්‍යාංශය,
385, "සුවසිරිපාය",
පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

ඇමුණුම - 04

## සෞඛ්‍ය අමාත්‍යාංශයේ විධායක සේවා ගණය (නීති නිලධාරි)

01. **විභාගයේ නම** : සුවිශේෂි කාර්යය සාධනය යටතේ උසස් වීම සඳහා වන අභියෝග්‍යතා පරීක්ෂණය

02. **විභාගය පිළිබඳ විස්තර** :

| ප්‍රශ්න පත්‍රය | කාලය | ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| අභියෝග්‍යතා පරීක්ෂණය | පැය 01 | 100 | 60 % |

03. **විභාගය පවත්වනු ලබන බලධරයා :** විභාග කොමසාරිස් ජනරාල් මගින්

04. **විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක්ද යන වග :** අවම වශයෙන් එක් වරක්

05. **විභාගය සඳහා වන විෂය නිර්දේශය :**

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| අභියෝග්‍යතා පරීක්ෂණය | තමා වෙත පැවරෙන සියලු කාර්යයන් සාමාන්‍ය කාර්යක්ෂමතා මට්ටම ඉක්මවූ කාර්යක්ෂමතාවයකින් යුතුව ඉටු කිරීම සඳහා අවශ්‍ය වන දැනුම,කුසලතා හා ආකල්ප මෙන්ම අපේක්ෂිත ප්‍රවීණතාවයක් අත්පත් කරගෙන තිබේද යන්න මැන බැලීම සඳහා සකස් වූ ප්‍රශ්න පත්‍රයකි.. |

සකස් කළේ :

අත්සන : ......(අත්සන)......

නම : එම්.ඒ.ආර්.පී.අභයගුණවර්ධන

තනතුර : අධ්‍යක්ෂ (පාලන) VI

දිනය : 2013/01/18

පරීක්ෂා කළේ :

අත්සන : ......(අත්සන)......

නම : වී.වික්‍රමරාජා

තනතුර : නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන) I

දිනය : 2013.01.18

අත්සන : ......(අත්සන)......

(දෙපාර්තමේන්තු ප්‍රධාන)

නම : වෛද්‍ය පී.ජී.මහීපාල

තනතුර : සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්

දිනය : 2013.01.24

නිලමුද්‍රාව : 

වෛද්‍ය පී. ජී. මහීපාල
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්
සෞඛ්‍ය අමාත්‍යාංශය,
385, "සුවසිරිපාය",
පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

ඇමුණුම - 05

**සෞඛ්‍ය අමාත්‍යාංශයේ විධායක සේවා ගණය (නීති නිලධාරි)**

01. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පැවැත්වීමට අදාල කරුණ : සෞඛ්‍ය අමාත්‍යාංශයේ ප්‍රධාන නීති නිලධාරි තනතුරට බඳවා ගැනීම සඳහා වන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය

02. ලකුණු ලබා දිය යුතු ක්ෂේත්‍ර :

| පරීක්ෂා කර ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ක්ෂේත්‍ර | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරා ගැනීම සඳහා සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 1. සේවා පළපුරුද්ද | 50 | ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාවය මත වැඩිම ලකුණු ලබාගත් අයෙකු බඳවාගනු ලැබේ. |
| 2. කුසලතාවය | 50 | |
| එකතුව | 100 | |

සකස් කළේ :

අත්සන : ............................................

නම : එම්.ඒ.ආර්.පී.අභයගුණවර්ධන

තනතුර : අධ්‍යක්ෂ (පාලන) VI

දිනය : 2013/01/18

පරීක්ෂා කළේ :

අත්සන : ............................................

නම : වී.වික්‍රමරාජා

තනතුර : නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන) I

දිනය : 2013. 01. 18

අත්සන : ............................................

(දෙපාර්තමේන්තු ප්‍රධාන)

නම : වෛද්‍ය පී.ජී.මහීපාල

තනතුර : සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්

දිනය : 2013. 01. 24

නිලමුද්‍රාව :

වෛද්‍ය පී. ජී. මහීපාල
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්
සෞඛ්‍ය අමාත්‍යාංශය,
385, "සුවසිරිපාය",
පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

# ඇමුණුම - 06

## සෞඛ්‍ය අමාත්‍යාංශයේ විධායක සේවා ගණයෙහි (නීති නිලධාරි තනතුරු) සේවයේ යෙදී සිටින්නන් නව ශ්‍රේණි ක්‍රමයට අන්තර්ග්‍රහණය කිරීම.

(මෙම බඳවා ගැනීමේ පරිපාටිය ක්‍රියාත්මක වන දිනට සේවයේ යෙදී සිටින්නන්ට පමණක් අදාළ වේ.)

නව බඳවා ගැනීම් පරිපාටිය ක්‍රියාත්මක වන දින සිට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 06/2006(iv) මගින් ලබා දී ඇති SL - 01- 2006 (A) වැටුප් පරිමාණය යටතේ වැටුප් ලබන නීති නිලධාරීන් සියළු දෙනාම ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 4 වගන්තියේ විධිවිධාන වලට යටත්ව පහත සඳහන් ශ්‍රේණි ක්‍රමයට අන්තර්ග්‍රහණය කරනු ලැබේ. සේවා කාලය ගණන් ගත යුත්තේ එම තනතුරට පත් කරන ලද දිනය පදනම් කරගෙනය. කෙසේ වෙතත් අන්තර්ග්‍රහණය හේතුවෙන් අදාළ නිලධාරියාගේ වැටුප් වර්ධක දිනයෙහි වෙනසක් සිදු නොවිය යුතු අතර, එම දිනය අන්තර්ග්‍රහණයට පෙර පැවැති වැටුප් වර්ධක දිනය වශයෙන් නොවෙනස්ව ක්‍රියාත්මක විය යුතුය. එසේම වැටුප් පරිවර්තනයේ දී අදාළ නිලධාරියා අවසන් වරට ලබමින් සිටි වැටුප් පියවර නව වැටුප් පියවරට අනුරූපී වීම මත ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 4 වගන්තිය අනුව ඊළඟ වැටුප් පියවරේ තැබීම ද සිදු නොකළ යුතුය.

(i) SL - 01 - III ශ්‍රේණිය

(අ) SL - 01 - 2006 (A) වැටුප් පරිමාණය යටතේ III ශ්‍රේණියට අදාල වැටුප් නියම කර ඇති තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් අවුරුදු 10 ක සේවා කාලයක් සම්පූර්ණ කර නැති නිලධාරීන්,

(ආ) III ශ්‍රේණියට අදාල වැටුප් නියම කර ඇති තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් අවුරුදු 10ක සේවා කාලයක් සම්පූර්ණ වුවද II ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීම සඳහා සෙසු සුදුසුකම් සපුරා නොමැති නිලධාරීන්,

SL - 01 - III ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

(ii) SL - 01 - II ශ්‍රේණිය

(අ) ඉහත සඳහන් පරිදි III ශ්‍රේණියට අදාළ වැටුප් නියම කර ඇති තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් අවුරුදු 10 කට නොඅඩු එහෙත් අවුරුදු 20 කට අඩු සේවා කාලයක් සම්පූර්ණ කර ඇති එමෙන්ම අවම වශයෙන් අවුරුදු 10 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති අදාළ කාලය තුළ වැටුප් වර්ධක දහය (10) ක් උපයාගෙන හා ඇති නව බඳවා ගැනීමේ පරිපාටිය ක්‍රියාත්මක වීමට පෙර ක්‍රියාත්මකව පැවති බඳවා ගැනීම් පරිපාටි අනුව අනෙකුත් සේවා අවශ්‍යතා සපුරා ඇති නිලධාරීන්,

(ආ) SL - 01 - 2006 (A) වැටුප් පරිමාණය යටතේ II ශ්‍රේණියට අදාළ වැටුප් නියම කර ඇති තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් අවුරුදු 10 ක සේවා කාලයක් සම්පූර්ණ කර නැති නිලධාරීන් ,

(ඇ) ඉහත සඳහන් පරිදි II ශ්‍රේණියට අදාළ වැටුප් නියම කර ඇති තනතුරක හෝ ශ්‍රේණියක සේවා කාලය අවුරුදු 10 ක් සම්පූර්ණ වුවද, ඉහත සඳහන් අනෙකුත් අවශ්‍යතා සපුරා නොමැති නිලධාරීන්,

SL - 01 - II ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

| | |
|---|---|
| සකස් කළේ : | පරීක්ෂා කළේ : |
| අත්සන : ...................... | අත්සන : ...................... |
| නම : එම්.ඒ.ආර්.පී.අභයගුණවර්ධන | නම : වී.වික්‍රමරාජා |
| තනතුර : අධ්‍යක්ෂ (පාලන) VI | තනතුර : නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන) I |
| දිනය : 2013/01/18 | දිනය : 2013.01.18 |

අත්සන : ......................

(දෙපාර්තමේන්තු ප්‍රධාන)

නම : වෛද්‍ය පී.ජී.මහිපාල

තනතුර : සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්

දිනය : 2013-01-24

නිලමුද්‍රාව : ......................

වෛද්‍ය පී. ජී. මහිපාල
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්
සෞඛ්‍ය අමාත්‍යාංශය,
385, "සුවසිරිපාය",
පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.